# වෂර් 2021 ක්වු අප්‍රේල් මස 09 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 W.M.G.W.C.B වේරපිටිය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07.U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08. R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. D.M දීසායු මංජුල දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. . R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13 M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14.M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. 43.K සුප්පයියා ජීවා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19. W .ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20. M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23. H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24. තංගවේලු කාමරාජන් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

25.N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

26.A.C මොහොමඩ් ෆසාල් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

27.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28.මුතු නීලමේගම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

29. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30.G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31.H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

32. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

33. H.G සුබද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

34.ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

35.පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

36.චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

37.W.D.G ගුණතිලක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39.R.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

41.කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

42. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

43.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරිම</u>

පසුගිය මාතර්‍ු මස 18 මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පසුගිය මාතර්‍ු මස 18 මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය

පසුගිය මාතර්ු මස 18  මහ සභා වාර්‍ථාව සත්‍ය වාර්‍ථාවක් ලෙස පිලිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව සභා වාර්‍ථාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

( 2.1) 2021.01.19 දිනැති  මහ සභා වාර්‍ථාව රුස්වීම් වාර්‍ථාව රීති ප්‍රකාරව  සකස් කර ඇති බවට පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්ාලය මගින් එවා ඇති නිවේදනය සභාගත කරන ලදි.

(2.2) 2021.02.18 දිනැති  මහ සභා වාර්‍ථාව රුස්වීම් වාර්‍ථාව රීති ප්‍රකාරව  සකස් කර ඇති බවට පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්ාලය මගින් එවා ඇති නිවේදනය සභාගත කරන ලදි.

(2.3) උඩපළාත  ප්‍රාදේශීය සභාවේ සභික ධූර පුරප්පාඩුව පිරවීමට  අදාල ගැසට් නිවේදනයට අනුව පළාත් පාලන ආයතන ජන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරිය ) 66 (අ) වගන්තිය ප්‍රකාරව උඩපළාත  ප්‍රාදේශීය සභාවේ  පුරප්පාඩු වූ මන්ත්‍රී ධූරය සඳහා නව සභිකයා ලෙස දසනායක මුදියන්සේලාගේ චාමික රුවන් දසනායක  මහතා තෝරා පත්කරගෙන ඇති බවට එවා ඇති නිවේදනය සභාගත කරන ලදි.

(2.4) උඩපළාත  ප්‍රාදේශීය සභා සංවධර්න  කටයුතු වලට අදාල ගොනු නියැදියන් පරීක්ෂාවේදී අනාවරනය වූ කරුනු සදහන් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්ාලය මගින් එවා ඇති විමෂර්න වාර්‍ථාව සභාගත කරමින් කමර්ාන්ත ආරම්භ කිරීමට ප්‍රථම මුද්දර ගාස්තු ගෙවා ගිවිසුම් අත්සන් කර  ඉන් අනතුරුව කමර්ාන්ත ආරම්භ කල යුතු බව  දන්වා එවා ඇති  නිවේදනය සභාගත කරන ලදි.

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සදහන් කරන ලදි.

4.කල් දී ඇති ප්‍රශ්න - නොමැති බව සදහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
5.කල් දී ඇති යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1)

5(1.1) පුස්සැල්ලාව සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේදී ව්‍යාපෘතිය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් රු.මිලියන 80 ක ණය මුදලක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. ලබාගන්න ණය මුදලට අදාල වාරික මුදල බැංකු ස්ථාවර නියෝගයක් මගින් ආපසු ගෙවීමටත් ණය මුදල ගෙවී අවසන් වන තුරු කිසිම හේතුවක් නිසා මෙම ස්ථාවර නියෝගය අවලංගු නොකිරීමටත් මෙම ස්ථාවර නියෝගය සභාවේ පොදු අරමුදල් ගිනුම යටතේ ලබාදෙන බවත්

2. යම් හෙයකින් ණය මුදල ආපසු ගෙවීම සභාව මගින් පැහැර හැරිය හොත් සභාව වෙත අයවීමට ඇති උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් ණය මුදල අයකර ගැනීමේ බලය පළාත් පාලන කොමසාරිස්තුමාට සහ ප්‍රධාන ලේකම්තුමාට පැවරීමට කටයුතු කිරීම සුදුසු බවත් මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (2)</u>

5(1.2) වත්තේහේන ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ජල නළ උපාංග එස්ලෝන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්,සෙන්ට්‍රල් ඉන්ඩ්‍රස්ට්‍රීස් PLC (National PVC),සෙන් ඇන්තනීස් ඉන්ඩ්‍රස්ට්‍රීස් ගෲප් (ඇන්ටන් PVC) යන ආයතන වලින් මිළ ගණන් කැඳවා මිළට ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (3)</u>

5(1.3) හිජ්රාගම ජල පොම්පාගාරය ජල බෙදා හැරීම නොකරන බැවින් සභාපතිතුමා නමින් ඇති විදුලිය විසන්ධි කර හිඟ විදුලි බිල්පත වන රු.5270.32ක මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1.4)</u>

5(1.4) S/N – E75667L8N330231) යන බ්‍රදර් මුද්‍රණ යන්ත්‍රය 2019 වෂර්යේ රු.24500.00ක මිළකට මිළදීගෙන ඇති අතර එම යන්ත්‍රය මේ වන විට ක්‍රියාවිරහිත වි ඇති බවත් එහි අළුත්වැඩියා කටයුතු සඳහා රු.22000.00 ක් වැය වන බව ඇස්තමේන්තු කර ඇති බැවින් මුද්‍රණ යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා මහ සභා තීරණයක් අවැසි බව මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1.5)</u>

5(1.5) පුස්තකාල මට්ටමේ තරඟ පැවැත්වීම සඳහා එක් පුස්තකාලයකට රු.5000.00 බැගින් පුස්තකාල 6 සඳහා රු.30000.00ක මුදලක් වැය වන බවත් ප්‍රාදේශීය මට්ටමේ තරඟ පැවැත්වීම සඳහා විනිශ්චය මණ්ඩල ගෙවීම් හා සහභාගි වන ළමුන් හා විනිශ්චය මණ්ඩල සංග්‍රහ කටයුතු සඳහා රු.40000.00ක් ලෙස මුළු වියදම රු.70000.00 මුදලක් වැය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1.6)</u>

5(1.6) උඩපළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මහනුවර අභියාචනා මහාධිකරනයේ විභාග වූ නඩු අංක ප්‍රති 27/20දරණ නඩුව සඳහා 2021.03.18 දින පෙනී සිටීම වෙනුවෙන් රු.7500.00 ක මුදලක්ද විරෝධතා ගොනු කිරීම සඳහා රු.15000.00ක් දවශයෙන් නීතිඥ ගාස්තු ලෙස නීතිඥ යූ.ඒ බෝගහපිටිය මහතාට ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1.7)</u>

5(1.7) 2021.03.29 දිනැති ඵලදායිතා මෙහෙයුම්කමිටු තීරණ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1.8)</u>

5(1.8) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටියා වූ උඩපළාත ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යනු ලබන මංමාවත් පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 (1) උප වගන්තියෙන් සභාව සතු කර ගැනීම සඳහා 2021.04.01.දින සිට 2024.04.01දින දක්වා කාලය අවසර ඇති කාලය ලෙස සැලකීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1.9)</u>

5(1.9) අංක 159. නුවරඑළිය පාර,පාරදෙක , ඒ.ඇලෙක්සැන්ඩර් මහතා විසින් පාර දෙක සුසාන භූමි ඉඩමේ ඉදිකිරීම් ආරම්භ කර ඇති ගොඩනැගිල්ල ඉවත් කිරීම හා අංක 317/14, පිහිල්ල දෙනිය, ගම්පොල. පී.ජී.ශාන්තකුමාර වීරකෝන් මහතා විසින් අනතුරු දායක ලෙස ඉදිකර ඇති ගොඩනැගිල්ල ගලවා ඉවත් කිරීමසම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>තීරණ අංක 05 (1,10)</u>

5(10) උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මස් වෙළදාම පිලිබඳ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙම යෝජනාව සංශෝධන සහිතව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කරන ලෙස සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (2,1)</u>

<u>ගරු කුමාරවේළු කනගරත්නම් මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2 .1) වතු ජනතාවගේ නම් ඡන්ද හිමි නාම ලේඛනයෙන් ඉවත් කර ඇති බැවින් එම නම් නැවත ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු තංගවේළු කාමරාජන් මන්ත්‍රීතුමා</u>

ගලත පමණක් නොව අපේ ග්‍රාමසේවා වසම් වලද මේ තත්වයම පවත්නා බවත් වත්තේ ලයිම් කාමරවල අපි නැත්නම් ග්‍රාම නිළධාරි ලේඛනයෙන් නම කපා හරින බවත් නයාපාන වත්තේ වැඩ කරන නිසා අපේ වත්තේ පදිංචි අයෙකුගේ නම ඉවත් කල නිසා එම අයට දරුවා පාසලට ඇතුළත් කිරීමට අවස්ථාව නොලැබුණු බවත් සෑම පක්ෂයකම අදාළව ග්‍රාම නිළධාරින් දේශපාලනයෙන් කටයුතු කරන බවත් වත්තේ පදිංචි අය කුමන හෝ රැකියාවක් කර ඡන්දය පාවිච්චි කිරීම සඳහා ගමට එන විට එම අයගේ නම් ලේඛනයෙන් කපා හැර තිබෙන බවත් කනගරත්නම් මන්ත්‍රිතුමා මීට පෙර මහවිලවත්තේ පදිංච්ච සිටි බවත් දැනට ගම්පොල පදිංචි බවත් එම මන්ත්‍රීතුමාගේ නම් කපාහැර ඇති බවත් එහිදි ග්‍රාම නිළධාරි විසින් එම මන්ත්‍රීතුමාට මහවිලවත්තේ පදිංචිය සටහන් කල නොහැකි බවත් ගම්පොල පදිංචිය සටහන් කලහැකි බවත් දන්වා ඇති අතර නමුත් චන්ද්‍රසේන මහතා අපට ඡන්ද අයිතිය ලබාදුන් බවත් දිගම්බරන් මැතිතුමා හා වේළුකුමාර මැතිතුමා වතුවල සිටි අයගේ දරුවන් බවත් එම අයට ඡන්ද අයිතිය ලැබුණත් අපට නොලැබෙන බවත් එනිසා මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කරන ලෙස මම යෝජනා කරමි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

මෙම ගැටළුව ග්‍රාම නිළධාරින්ටද පවත්නා ගැටළුවක් බවත් යම්කිසි පුද්ගලයෙක් කොතැනක හෝ පදිංච්ච සිට වසර 5කින් පමණ ගමට ආවාට අදාළ ස්ථානයේ පදිංචි නොවනවානම් ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිළධාරින් විසින් තමාගේ ඉහළ නිළධාරින්ට වාර්ථා කල යුතු බවත් අදාළ ස්ථානයේ පදිංචි නොවනවානම් නම් ඇතුළත් නොවන බවත් මෙය විශාල ගැටළුවක් බවත් අදාළ ස්ථානයේ පදිංචි නොවනවානම් නම් ඒ සම්බන්ධව ග්‍රාම නිළධාරි දැනුවත් කල යුතු බවත් මේ දේවල් බොහෝ වේලාවට ගැසට් මඟින් හෝ පුවත්පත් මඟින් ඡන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සිදුකරන බවට දැනුවත් කරන බවත් නමුත් රටේ ජනතාව මේ සම්බන්ධයෙන් නොදන්නා බවත් දුරකථනයටද මේ සම්බන්ධ තොරතුරු එවන බවත් ග්‍රාම නිළධාරින් විසින් අදාළ පෝරමය සියළු දෙනා වෙත යොමු කරන බවත් සත්‍ය ලෙසටම පදිංචි නොමැති නම් කල හැකි දෙයක් නොමැති බවත් එනිසා යැවිය යුතු ස්ථාන වලට යොමු කිරිමට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

තම තමන්ගේ දුරකථන වලට ඡන්ද හිමි නාම ලේඛනයේ නම තිබෙනවාද නැද්ද කියා දැනුවත් කරන බවත් කොට්ඨාශයේ නියෝජිතයාට ඡන්ද හිමි නාම ලේඛනය ඉදිරිපත් කරන බවත් යම් අවශ්‍යතාවයකට ග්‍රාම නිළධාරි හමු වී ලිපියක් ලබා ගැනීමට යාමේදී එම අයගේ නම ලියාපදිංචි වී නැත්නම් ලිපි නිකුත් නොකරන බවත් මෙය පුරවැසියන්ගේ වරදක් බවත් 2021 වසරට අදාළව ලියාපදිංචිය අවසන් කර ඇති බවත් 2022 වසරට නීත්‍යානුකූලව නම් ඇතුළත් කරගැනීමට කටයුතු කරගන්නා ලෙසට ඉල්ලා සිටින ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තමා මේ සම්බන්ධයෙන් ගත් සභා තීරණය ප්‍රාදේශීය ලේකම්තුමියට,දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට,ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට යොමු කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (2,2)</u>

**<u>ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමියගේ යෝජනා</u>**

(5) (2.2) පළාත් පාලන මහජන නියෝජිතයින් වෙනුවෙන් තනතුරේ සිටියදී හා ඉන් අනතුරුවත් ඔවුන් වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් රජය මඟින් සිදුකර ගැනීම සුදුසු බවත් අපි 2018 වසරේ නවක මන්ත්‍රිවරු ලෙස සභාව නියෝජනය කරන බවත් 1987 ප්‍රාදේශීය සභාව ස්ථාපනය කල බවත් බිම් මට්ටමේ තරුණ අය එකතු කර ගරු සභික යන නාමය රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ලබා දුන් බවත් අනු ගණන්වල ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුළත් සමරු පලකයක් ස්ථාපිත කර ඇති බවත් ජන සමාජයේ ඉහළ තැන්වල සිටින ජනාධිපතිතුමාට,අගමැතිතුමාට එම තැනට යාමට සහය ලබාදෙන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු වන අප විසින් බවත් අපි ගමේ ජනතාවගෙන් දොස් අහගෙන දේශපාලන කටයුතු වල නියැලෙන බවත් අපි එකිනෙකා ගැන බැලූ කල ශෝචනීය තත්වයක් උදාවී ඇති බවත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු යම්කිසි ආයතනයකට ගිය පසු කිසිවෙකු ගණන් නොගන්නා පහත් තත්වයට වැටී ඇති බවත් නමුත් අපේ ඡන්ද ලබාගෙන කටයුතු කරන අය යම්කිසි මුදලක් පමණක් ලබාදෙන බවත් රාජකාරිය අවසන් වී වෙස් වෙන යන අපව අමතක කරන බවත් පසුගිය කාලයේ සිදු වූ යම් දුක්බර සිද්ධියකදී සභාපතිතුමා මරණයට පත්වූ සුසන්ත මන්ත්‍රීතුමාගේ පවුල වෙනුවෙන් කල උපකාරයට තමා ස්තුතිවන්ත වන බවත් අපි කරන සේවයට යම්කිසි ඇගයීමක් කල යුතු බවත් අපේ දරුවන්ට හෝ වැඩ පිළිවෙළක් සකස් කල යුතු බවත් ඒ වෙනුවෙන් අපි නැගී සිටිමු යැයි මම යෝජනා කරමි

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

ඩිමෝෂි මන්ත්‍රීතුමිය මහජන නියෝජිතයෙකු ලෙස ලද අත්දැකීම් මත යෝජනාව ගෙනවිත් ඇති බවත් මෙයට පෙර උප සභාපතිතුමා,අගලවත්ත මන්ත්‍රීතුමා සහ තමා මේ සම්බන්ධයෙන් කථා කල බවත් චන්ද්‍රිකා මැතිණිය ජනාධිපති කාලයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් ලබාදීමට විස්තර ලබාගත් බවත් අඩුම තරමින්වත් කිසිවක් සිදු නොවූ බවත් ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාද මේ සම්බන්ධයෙන් කථා කලත් ඵලක් නොවූ බවත් අපට යතුරුපැදියක් ලැබුණු නමුත් නවක මන්ත්‍රීවරුන්ට එම අවස්ථාවද නොලැබුණු බවත් සුසන්ත ප්‍රියදර්ශන මන්ත්‍රීතුමාගේ අවමංගල අවස්ථාවේ මේ තත්වය අපි දුටුව බවත් එනිසා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ත්‍රීවිල් රථයක් හෝ ලබාදෙන ලෙස ඉල්ලීම් කර පළාත් පාලන ඇමතිතුමාට යොමු කල යුතු බව සඳහන් කරමින් ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**<u>කමර්ාන්ත අනුමැතිය</u>**

**<u>කමර්ාන්ත යෝජනා</u>**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමාගෙන් රු. ලක්ෂ 30ක මුදලක් ලැබුණු බවත් එම මුදලින්

1* අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රු.2000,000.00
2* වජ්ලි පාසලට පිවිසෙන පාළම සංවර්ධනය කිරීම සඳහා රු.1000,000.00

ලෙස යොදාගන්නා බවට මම යෝජනා කරමි.

<u>ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

(5) (2.3) නිල්ලඹ ග්‍රාම සේවා වසමේ මහ කැලේ කොටසේ ඩී.ජී.දසනායක මහතාගේ නිවස අසල මාගර්ය සංවර්ධනය කිරිම කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්තය ලෙස නිල්ලඹ මහ විදුහල අසළ ලියනගේ මහතාගේ කඩය අසළින් ඉදිරියට දිවෙන මාගර්ය සංවර්ධනය කිරීම රු.200000.00 කමර්ාන්තය සිදුකිරීම සුදුසු බව මම යෝජනා කරමි.

(5) (2.4) පරණ නිල්ලඹ අප්පපිල්ල කඩය අසළින් ගමට යන මාගර්යේ කාණු පද්ධතිය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්තය ලෙස නිල්ලඹ අප්පපිල්ල කඩය අසළින් ගමට යන මාගර්ය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම රු.300000.00 කමර්ාන්තය සිදුකිරීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු නීල් සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.5)වනහපුවේ සිට අක්කරමලේ දෙසට යන මාගර්ය සංවර්ධනය කිරිම (රු.125,000.00), වනහපුව පිහිල්ල සංවර්ධනය කිරිම (රු.50,000.00), දුනුකේඋල්ල කහටදෙනිය පිහිල්ල සංවර්ධනය කිරිම(රු.50,000.00), දුනුකේඋල්ල අමුණුවල පිහිල්ල සංවර්ධනය කිරිම(රු.50,000.00) යන කමර්ාන්ත වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස පතන සුසානභූමියේ ප්‍රවේශ මාගර්ය ඉදිකිරිම රු.200,000.00 ක කමර්ාන්තය හා දුනුකේඋල්ල ඉල්ලත්ත මඩ ළිඳ සංවර්ධනය කිරිම කමර්ාන්තය සඳහා කලින් වෙන්කල මුදල ද ඇතුළුව රු.125,000.00 කමර්ාන්ත සිදුකිරීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු ඩබ්.ප්‍රේමතිලක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.6) හල්ඔය හරහා ගල්ඔය අතර ඇතිකුඩා පාලම ඉදිකිරිම කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්තය ලෙස හල්ඔය වටගොඩ අබේවර්ධන මහතාගේ වෙළඳසැල අසළින් පහළට ඇති මාගර්ය සංවර්ධනය කිරිම රු.200000.00 කමර්ාන්තය සිදුකිරීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය</u>

ඉහත සඳහන් කමර්ාන්ත යෝජනා සහ සංශෝධන යෝජනා සියල්ල ඉටුකිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>**(6) කාරක සභා වාථර්ා *කමිටු වාතර්ා* ඉදිරිපත් කිරීම**</u>

1. මාතෘ මාසයට අදාළ ධාවන සටහන් වාර්තා ඉදිරිපත් කිරීම

2.උඩපළාත ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව 2021.03.18

3. ටෙන්ඩර් කමිටු වාර්තාව 2021.03.30

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

ඉදිරිපත් කර ඇති කමිටු වාර්තා සියල්ල පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු කීතසිරි රත්නායක මන්ත්‍රීතුමා</u>

කමර්ාන්ත කමිටු තීරණ කිහිපයක් අපි ලබාගත් බවත් එහිදී ගිවිසුම් අත්සන් කිරිමේදි නියමානුකූලව කටයුතු කරන ලෙසට විගණනයෙන් දන්වා ඇති පරිදි එයට අනුගත වී අපි කටයුතු කරමු යැයිද නමුත් එහි මුද්දර ගාස්තු අයකිරීම වැඩි බවත් ගිවිසුම් ගාස්තු අපට නොලැබෙන බවත් රු.100,000.00ට අඩු මුදලකට මුද්දර ගාස්තු ලෙස රු.100.00 අයකරන බවත් රු.500,000.00 දක්වා මුද්දර ගාස්තු ලෙස රු.500.00 අයකරන බවත් අපේ සභාවේ පමණක් මෙලෙස විශාල මුදලක් අය කරන බවත් මුදල වැඩි නිසා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමසා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා එවන ලද නිරීක්ෂණ වලට අනුව අටවෙනි කරුණ වෙත අවධානය යොමු කරමින් අපි යම් කමර්ාන්තයක් ඉටු කරනවා නම් ඒ සම්බන්ධයෙන් සැළැස්මක් ඉදිරිපත් කල යුතු බවත් ගිවිසුම් අත්සන් කරන විට සැළැස්ම ලබාදිය යුතු බවත් කොන්ක්‍රිට් පාරක් සංවධර්නය කරන විට කොන්ත්‍රාත්කරු අපහසුතාවයට පත් වන නිසා කොන්ක්‍රීට් පාරේ දික් අඩි හා ඝනකම ලබාදිය යුතු බවත් ඉදිරියේදී ගිවිසුම් කොපියක් සමඟ සැළැස්ම ලබාදිය යුතු බව අවධාරණය කරන ලදි.තවද සභාවේ අරමුදල් වැය කරන විට ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව ගැන සැලකිළිමත් විය යුතු බවත්අවම වශයෙන් පවුල් 5ක්වත් තිබිය යුතු බවත් මාගර්යක් සංවධර්නය කරන විට එහි අවසාන තැන සිට ඉදිරියට කරගෙන ආ යුතු බවත් සඳහන් කරන ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

තත්ව පරීක්ෂන වාර්තාව ලබා ගැනීමට මුදලකුත් වියදම් කර තුන් හතර වතාවක් මග නැගුම ආයතනයට යන්න වන බවත් අදාල බිල්පතට අදාල ලාභාංශය එකතු කල යුතු බවත් ගෙවන ගාස්තුව බිල්පතට අමතරව ලාභාංශයක් ලෙස කොන්ත්‍රාත් කරුට ලබා දිය යුතු බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මේ සම්බන්ධයෙන් හැමෝටම පහසු වන ලෙස අපි නීතියානුකූලව අමතර වියදම් නොවන පරිදි කටයුතු කරමු යැයි සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

*ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා*

**(7) ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම -**

2021 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**ආදායම් වියදම් වාර්තාව - 2021 පෙබරවාරි**

| | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| **10** | වරිපනම් හා බදු | | | 1 | වැටුප් හා දීමනා | 4,779,244.67 |
| i | වරිපනම් හා බදු | 104,565.96 | | | | |
| ii | අක්කර බදු | 435.00 | | 2 | ගමන් වියදම් | 161,777.00 |
| iii | ජල ගාස්තු | 11,825.00 | | | | |
| iV | ව්‍යාපාර බදු | 55,750.00 | 172,575.96 | 3 | සැපයුම් හා උපකරණ | 322,832.00 |
| **20** | කුළී | | | | | |
| i | ගෙවල් කුළී | 2,375.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | |
| ii | වෙළඳ අයිතිය බදු දීම | 269,483.33 | | | අළුත්වැඩියාව හා නඩත්තුව | 1,580.55 |
| iii | පොදු වැසිකිළිය | | | | | |
| iv | බදු මුදල් | 3,000.00 | | | | |
| v | කුලියට දීම | | 274,858.33 | | | |
| **30** | බලපත්‍ර ගාස්තු | | | | | |
| i | වෙළඳ බලපත්‍ර | 159,250.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 419,102.31 |
| ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 10,800.00 | 170,050.00 | | | |
| **40** | සේවා සඳහා ගාස්තු | | | | | |
| i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 169,800.40 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 14,662.67 |
| ii | අය කර ගත හැකි ගාස්තු | 292,478.35 | 462,278.75 | | | |
| **50** | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| i | දඩ මුදල් | 18,025.00 | 18,062.10 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | 37.10 | | | | |
| **60** | වෙනත් ආදායම් | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| ii | විකුණුම් | 207,794.00 | | | | |
| iii | මුද්දර ගාස්තු | - | | | | |
| iV | සේවක ණය පොලී | 50,119.76 | 257,913.76 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | - |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | 4,114,207.96 | | | | |
| ii | සාමූහික ආධාර | 60,000.00 | 4,174,207.96 | | | |
| **80** | මූලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | - |
| i | මූලධන ආධාර | | - | | සේවක ණය | 1,061,100.00 |
| සේවක ණය | | | 317,434.00 | | ණයහිමි ගෙවීම් | 3,015,758.52 |
| තැන්පත් | | | 297,435.82 | | තැන්පත් | 585,411.71 |
| කර්මාන්ත ණයගැති ලැබීම් | | | | | අතිරික්තය | |
| අත්තිකාරම් පියවීම | | | 6,500.00 | | | |
| අගරු චෙක් | | | - | | | |
| ඌනතාවය | | | 4,210,152.75 | | | |
| | | | **10,361,469.43** | | | **10,361,469.43** |

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

2021 ආදායම් වියදම් වාර්තාවට අනුව ඌනතාවයක් හැටියට රු.4,210,152.75 වියදමට සාපේක්ෂව ගැලපීමක් කර ඇති බවත් රු.10,361,469.43 බවත් ඌනතාවයක් හැටියට රු.4,210,152.75 ක මුදලක් සඳහන්වී ඇති මුත් ණය හිමි ගෙවීම් වලදී කමර්ාන්ත සඳහා රු.2,189,258.36 ක මුදලක් පෙන්නුම් කරත් රු.3,015,758.52 ක මුදලක් පැරණි ණය හිමි කමර්ාන්ත සඳහා ගෙවීම් කර ඇති බවත් 2,83,718.16ක් විවිධ ණය හිමි ගෙවීම් සඳහා රු.542,782.00 ක මුදලක් ඌනතාවයට සාපේක්ෂව සභාවේ කාරනාවලට හා තැන්පත් ආපසු ගෙවීම් යටතේ ඉටු කර ඇති බවත් සාමාන්‍ය ගමන් වියදම් දීමනා ගැන සඳහන් කර ඇති බවත් ප්‍රාග්ධන වැය ලෙස මුදලක් සඳහන් නොවුනත් පසුගිය කාලයේ ණය හිමි ගෙවීම් සඳහා මුදලක් සඳහන්වී ඇති බවත් සමස්ථ ආදායම ලෙස රු.10,361,469.43 ක් වියදමට සාපේක්ෂව ගලපා ඇති බවත් සඳහන් කරමින් පෙබරවාරි මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව හා ඒකාබද්ධ ආදායම් සාරාංශය පිලිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කෝකිලා වරාහේන මන්ත්‍රීතුමිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

මැයි මස මහ සභාව එම මස 20 වන දින පැවැත්වෙන බව සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින සභාවට නොපැමිනි ගරු ***මන්ත්‍රීතුමන්***ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.

**ගරු මංජුල දිසානායක මන්ත්‍රීතුමා**

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි

**ගරු කීතර්‍රී රත්නායක මන්ත්‍රීතුමා**

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**8. වෙනත්**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු වඩිවෙල් රවී මන්ත්‍රීතුමාගෙන් හිස් වූ මන්ත්‍රී ධූරය සඳහා අළුතින් පත් වී ආ ගරු චාමික රුවන් දසනායක මන්ත්‍රීතුමාට මහ සභාව ආමන්ත්‍රණය කිරීම සඳහා අවස්ථාව ලබාදෙන බව සඳහන් කරන ලදි.

**ගරු චාමික රුවන් දසනායක මන්ත්‍රීතුමා**

ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ නියෝජනය කරමින් තමා අද මෙම ස්ථානයට පැමිණ සිටින බවත් මෙම අවස්ථාවේදී තම පක්ෂයේ නායක මනෝ ගනේෂන් මැතිතුමාටද මහනුවර දිස්ත්‍රික් පාලර්‍මේන්තු මන්ත්‍රී වේළුකුමාර මැතිතුමාටද විශේෂ ස්තූතිය පුද කරන බවත් මෙම පක්ෂය ද්‍රවිඩ ජාතික පක්ෂයක් බවත් උඩපළාතේ අපේ පක්ෂයේ සියළුම අපේක්ෂකයින් ද්‍රවිඩ ජාතික සහෝදරයින් බවත් ඔවුන් සියළු දෙනාගේම කැපකිරීම හා ඉල්ලීම මත සිංහල ජාතිකයෙකු වන තමාට මෙම මන්ත්‍රී ධූරය ලබාදුන් බවත් තමාට පෙර මෙම මන්ත්‍රී ධූරය දැරූ ගරු වඩිවෙල් රවී මන්ත්‍රීතුමාද උඩපළාත ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් කල බවත් එතුමාගේද ඉල්ලීම මත තමා මෙම තනතුරට පත් වූ බවත් සඳහන් කරමින් තමාට මෙම තනතුරට පත්වීම සඳහා උදව් උපකාර කල සියළුම දෙනාට නැවත වාරයක් ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි.

ගරු <u>උප සභාපති</u> **අසේල අමරසේන** මහතා

ගරු චාමික රුවන් මන්ත්‍රීතුමා පුස්සැල්ලාව ප්‍රදේශය නියෝජනය කරමින් දිවුරුම් දුන් බවත් අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයට ඔබතුමාව සාදරයෙන් පිළිගන්නා බවත් විශේෂයෙන් මීට පෙර සභාව නියෝජනය කල වඩිවෙල් රවී මන්ත්‍රීතුමා වසර 2ක පමණ කාලයක් අපත් සමඟ සහෝදරත්වයෙන් කටයුතු කල බවත් එතුමා නියෝජනය කල කොට්ඨාශයට එතුමා විශාල මෙහෙවරක් කර ඇති බවත් එතුමාට හොඳ හදවතක් තිබූ බවත් නවක මන්ත්‍රී චාමික රුවන් මන්ත්‍රීතුමාද තමාගේ මිතුරෙකු බවත් ප්‍රාදේශීය සභා මැතිවරණයට නොමිනේෂන් දෙන අවස්ථාවේ අපේ පක්ෂයේ ඇති වූ ගැටළු හේතුවෙන් මෙතුමා ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ නියෝජනය කරමින් මැතිවරණයට ඉදිරිපත් වූ බවත් මේ වන විට මෙතුමා එම පක්ෂය නියෝජනය කරමින් සභාවට පැමිණ ඇති බවත් මන්ත්‍රීවරයෙකු ලෙස තමාගේ ගෞරවයද

ආරක්ෂා කර ගෙන මන්ත්‍රී ධූරයට හානි නොවන ලෙස ප්‍රදේශයේ ජනතාවට සේවය කරන ලෙස තමා මෙතුමාගෙන් ඉල්ලා සිටින බවත් හිටපු මන්ත්‍රී වඩිවෙල් රවී මන්ත්‍රීතුමා පිළිබඳව සභාවේ කථා කල බවත් එතුමාට ස්තූති කල බවත් සඳහන් කර ලිපියක් සකස් කර යවන ලෙසත් සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

නවක මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දුන් චාමික රුවන් මහතා ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගන්නා බවත් පුස්සැල්ලාව ප්‍රදේශයේ වැදගත් පවුලකින් පැවත එන මෙතුමා එක්සත් ජාතික පක්ෂයට වැඩ කල බවත් පසුව මනෝ ගනේෂන් මැතිතුමාගේ පක්ෂයෙන් ඡන්දයට ඉදිරිපත් වී ශාල ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් බවත් අද තමා නියෝජනය කල පක්ෂයෙන් නොව වෙනත් පක්ෂයකින් සභාව නියෝජනය කිරීමට පැමිණීම සම්බන්ධයෙන් තමාගේ ගෞරවය පුදකරන බවත් එතුමාට තමා නියෝජනය කරන පක්ෂය වෙනුවෙන් හා තම ජනතාව වෙනුවෙන් අතිමහත් සේවයක් කිරීම සඳහා අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

2021 අප්‍රේල් මස මහ සභාවට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් භාෂා පරිවර්තක මහතාටත්,ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට දළදා සමිඳු පිහිට ප්‍රාර්ථනා කරමින් වාද භේද අමතක කර මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාත් කායර් මණ්ඩලයේ සියළු දෙනාත් එකතුව 2021.04.24 වන දින නුවරඑළිය ප්‍රදේශයට චාරිකාවක් යාමට ආරාධනා කරමින් ප.ව.1.30.ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

| | |
|---|---|
| ලේකම් | සභාපති |
| උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාතප්‍රාදේශීය සභාව |